# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2414/02 - 2024 දෙසැම්බර් මස 09 වැනි සඳුදා - 2024.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නියෝග අංක : 90**

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

20 (5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 20 (5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, සාදන්නෙකු, සැපයුම්කරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති දේශීය සහල් වර්ග එහි සඳහන් කර ඇති උපරිම මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, සැපයීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම තොග මිල* | *උපරිම සිල්ලර මිල* |
|---|---|---|
| සුදු/රතු කැකුළු සහල් - දේශීය | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 215/- | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 220/- |
| සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය (මොට්ටෙයිකරුප්පන් සහ අට්ටකාරි හැර) | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 225/- | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 230/- |
| සුදු/රතු සම්බා - කැකුළු සහ වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය (සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 235/- | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 240/- |
| කීරි සම්බා - කැකුළු සහ වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 255/- | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 260/- |

මෙම නියෝගය 2024 දෙසැම්බර් මස 09 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.


1A - PG 6938 — 104 (2024/12)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2022 මැයි මස 02 වැනි දින අංක 2278/02 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 82 සහ 2022 ජුනි මස 10 වැනි දින අංක 2283/43 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 83 මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**කේ. එච්. ඩී. කේ. සමරකෝන්,**
සභාපති.

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0080

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.